## ඔබ සැමට සුභ නත්තලක් වේවා!



# ලෝකාලෝකය

## 2022 දෙසැම්බර් - 2023 පෙබරවාරි
## කලාපය

**දෙවියන්වහන්සේ ස්වකීය
ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම්
ලෝකයාට ප්‍රේම කළසේක.
එසේ කළේ උන්වහන්සේ (යේසුස්වහන්සේ)
කෙරෙහි අදහාගන්නා විනාශ නොවී
සදාතන ජීවනය ලබන පිණිසය
(යොහාන් 3:16)**



## 2023

## වසර ඔබ සැමට
## දෙවියන්වහන්සේගේ ආශිර්වාදය පිරි
## සෞභාග්‍යමත් නව වසරක් වේවා!

ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.
දුරකථන අංක : 011 2581901




# වටිනාම තෑග්ග



ආදර දුවේ පුතේ, කොහොමද ඉතින් ඔයාලට? පුංචි ඔයාලා හැමදෙනාම දෙවිපියාණන්වහන්සේගේ ආදරය, කරුණාව තුළ හොඳින් ඉන්න බව මම විශ්වාස කරනවා. අපි දැන් මේ අවුරුද්දේ අවසානයටම ඇවිත්. බලන්න, කාලය මොනතරම් වේගයෙන් ගත වෙනවද කියලා. වසරක අවසානය කියන්නේ පුංචි ඔයාලට වගේම වැඩිහිටියන්ටත් ප්‍රීතිමත් කාලයක්. මේ උත්සව කාලය නිසා අපි හැමෝම ඉන්නේ සතුටෙන්. ඉතින් දුවලා පුතාලා දන්නව නේද මේ නත්තල් කාලයේ අපි සිහිකරන්නේ කව්ද කියලා. ඔව්, යේසුස්වහන්සේ. ඉතින් යේසුස්වහන්සේ ඇයි මේ ලෝකෙට ආවේ කියලා මම අද ඔයාලට කියලා දෙන්නම්. ඒ පුංචි කතාවකුත් එක්ක.

එක්තරා ලස්සන ගමක තාත්තා කෙනෙකුයි පුතෙකුයි ජීවත් වුණා. මේ තාත්තා එයාගේ එකම පුතාට ගොඩාක් ආදරේ කළා. පුතත් තාත්තට හරිම කීකරුයි. ආදරෙයි. දවසක් තාත්තා හිතුවා මේ පුතාට තෑග්ගක් දෙන්න. බොහෝම වටින තෑග්ගක් දෙන්න. ඉතින් තාත්තා එයා ඉතුරු කරගෙන තිබුණ ඔක්කොම සල්ලි ටික දීලා ඉතා වටිනා ලී මිලදී අරගෙන ගොඩාක් මහන්සිවෙලා ලස්සන නැවක් හැදුවා. මේ නැව හරිම ලස්සනයි. ඉතින් මේ වටිනා ලස්සන තෑග්ගට මේ පුතා ගොඩක් ආදරේ කළා, ප්‍රවේසම් තැනක තිබ්බා. දවසක් වැස්ස වහින්නට පටන්ගත්තා. වැස්ස වැඩිවෙලා මිදුලේ වතුර පිරෙන්න ගත්තා. මේ පුතා එයාගේ නැව වතුරට දාලා සෙල්ලම් කරන්න පටන්ගත්තා. එකපාරටම වේගයෙන් ආපු වතුර පාරකට නැව ගහගෙන ගියා. මේ පුතා මොනතරම් උත්සහ කළත් නැව නවතින්නේ නැතුව වතුර පාරත් එක්ක ගහගෙන ගිහින් නොපෙනී ගියා.

පුතාට හරිම දුකයි. මෙහෙම දවස් කිහිපයක් ගත වුණා. දවසක් පාසල ඉවරවෙලා ගෙදර එනකොට පුතා දැක්ක ඔහුගේ මේ නැතිවුණ නැව සාප්පුවක විකුණන්නට තියලා තියෙනවා. පුතාට හරිම සතුටුයි. එයා කඩය ඇතුලට ගිහින් මුදලාලිට කිව්වා "මේක මගේ නැතිවුන නැව, මගේ තාත්තා මට මේක තෑගි දුන්නේ, මගේ නැව මට ආපසු දෙන්න" කියලා. නමුත් මේ නපුරු මුදලාලි කිව්වා "මේක කලින් ඔයාගේ වුණාට දැන් මගේ. ඔයාට ඒක ඕනේ නම් සල්ලි දීලා ගන්න" කියලා. මුදලාලි මේ නැවට නියම කළේ ඉතා විශාල වටිනාකමක්. ඉතින් මේ තාත්තා ඒ විශාල මුදල ගෙවලා නැවතත් එම නැව පුතාට අරන් දුන්නා. මේ කතාවෙන් දෙවියන්වහන්සේ හා අපගේ කතාව පිළිඹිබු වෙනවා. අපි හැමෝම අර නැව වතුරට ගහගෙන ගියා වගේ යේසුස්වහන්සේගේ අතින් ගිලිහිලා ගිහින් යක්ෂයාගේ නොහොත් සාතන්ගේ අතට හසු වුණා. දෙවියන්වහන්සේ අපට මොනතරම් ප්‍රේම කළාද කියනවා නම්, යක්ෂයාගේ අතින් අපව ගලවා ගන්නට උන්වහන්සේගේ එකම පුත්‍රයා අපි වෙනුවෙන් පූජා කළා. අපව ගලවා ගන්නට දෙවියන්වහන්සේ විශාල මිලක් ගෙව්වා.

දුවේ පුතේ යේසුස්වහන්සේගේ උපත ලෙස අපි ප්‍රීතියෙන් සමරන නත්තලේ සැබෑ තේරුම තමයි අපි සියලු දෙනාම අපේ පාපයෙන් ගලවා ගන්නට යේසුස්වහන්සේ මේ ලෝකයට පැමිණීම උන්වහන්සේ කුරුසියේ මරණය විඳිමින් උන්වහන්සේගේ ලේ තුළින් අපි සියලු දෙනාටම පාප සමාව දී තිබෙනවා. මේ වේලාවේ ඔයාගේ ඇස් දෙක වහලා උන්වහන්සේට කියන්න. "පියාණනි, මම කළ සියලු පාප වලට මට සමාව දෙන්න. යේසුස්වහන්සේගේ දරුවෙක් ලෙස මාව පිළිගන්න" කියලා. එතකොට නත්තලේ සැබෑ ප්‍රීතිය, සැබෑ සමාදානය ඔයාටත් ලැබේවි. මේ නත්තලේ ඔබට ලැබෙන වටිනාම තෑග්ග ඔබ උන්වහන්සේගේ දරුවෙක් බවට පත්වීමයි.

**"මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් දෙනතරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සෑම දෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය" (යොහාන් 3:16).**

ආදර,

**- ශෂිලා නැන්දා -**

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කවුද?

ප්‍රිය සහෝදර සහෝදරියනි,

2022 වසර ගෙවී ගොස් අවසන්ය. තව නොබෝ දිනකින් නව වසරකට අප පා තැබීමට නියමිතය. පසු වූ වසර තුළ අප ලැබූ අත්දැකීම් හා අප මුහුණ දුන් සිදුවීම් දෙස හැරී බලා ඒවා ප්‍රීතිදායක ද නැති නම් කණගාටුදායක ද කියා විමසා බලන්න. දැන් ඒ හැම අත්දැකීමක් හා සිදුවීමක් ගැනම දෙවියන්වහන්සේට ස්තූති කරන්න. මක්නිසාද දෙවියන්වහන්සේට ස්තූති කිරීම යහපත්ය. එම අත්දැකීම් තුළින් අප ආත්මික ලෙස ශක්තිමත් වූවා යැයි මා විශ්වාස කරමි. අප අපගේ ගැලවුම්කරුවාණන් ලෙස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහන්නේ නම් අප දෙවියන්වහන්සේට අයිති අයයි. අප එම සත්‍ය අමතක නොකරමු. උන්වහන්සේගේ දරුවෙකු ලෙස ඔබ මා මේ පොළවේ ජීවත්වීම උන්වහන්සේගේ කැමැත්තයි. උන්වහන්සේ කැඳවන තෙක් මෙහි අපට කැමැත්තෙන් හෝ අකමැත්තෙන් සිටිය යුතු වේ. එම කාලය අප ජීවත් වන්නේ කෙසේදැයි අපම තීරණය කළ යුතුව ඇත. මා ඔබට යෝජනා කරන්නේ පොළවේ අප සිටින කාලය දෙවියන්වහන්සේව විශ්වාස කරමින්, උන්වහන්සේගේ කැමැත්ත අනුව ජීවත් වීම හා උන්වහන්සේට සේවය කිරීම යන කාරණාවලට පමණයි. අප තෘප්තිමත් කළහැක්කේ, අන් සියල්ල නිෂ්ඵලය. අප සිතින් හොඳින් විමසා බැලුවහොත් ඒ බව වැටහේවි. එබැවින් ඔබගේ ගැලවුම්කාරයා ලෙස ක්‍රිස්තුස්වහන්සේ ඔබගේ සිතට පිලිගන්න. බයිබලය දිනපතා කියවන්න. සෑම විටම යාච්ඤා කරන්න. දෙවියන්වහන්සේගේ දරුවන් සමඟ නිතර ආශ්‍රය කරන්න. පුලුවන් හැම විටම අන් අයට සේවය කරන්න. උපකාර කරන්න. එමඟින් අපගේ ජීවිතයට මහත් වටිනාකමක් හා අර්ථවත් බවක් ලැබේ.

මෙම නත්තල් සමයේ අපගේ ගැලවුම්කාර ස්වාමිවූ යේසුස්වහන්සේගේ උත්පත්තිය සිහි කරන අතර නමස්කාර පූර්වකව හා ගෞරවාන්විතව උන්වහන්සේගේ උපත සිහිකිරීම කිතුණුවන්ට ඉතා වැදගත් වේ. එය තවත් උත්සවයක් හෝ කා බී විනෝද වීමට හේතුවක් කර නොගනිමු. දෙවියන්වහන්සේගේ ප්‍රේමය අන් අයට දැක්වීමට හා බෙදා ගැනීමට අවස්ථාවක් කර ගැනීමෙන් අපගේ ගැලවුම්කාරයාට මහත් ගෞරවයක් හා මහිමයක් ගෙන දිය හැක. මෙම නත්තල් සමයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කවුද? කියා වඩ වඩා දැන ගැනීමට හා අන් අයට උන්වහන්සේ ගැන කියා දීමට වෙහෙස වෙමු. ඒ සඳහා කැප වෙමු. ඔබ සැමට සුභ නත්තලක් හා සුභ නව වසරක් වේවා' යි යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්තරීතර නාමයෙන් ප්‍රාර්ථනා කරමි. දෙවියන්වහන්සේගේ ප්‍රේමය, ආශිර්වාද හා ශුද්ධාත්මයාණන් වහන්සේගේ සැනසිල්ල, සමාදානය හා වැඩ සිටීම 2023 අවුරුද්ද මුළුල්ලේම ඔබ සැම සමඟ වේවා !

- සංස්කාරක -
**එස්. මෙත්තානන්ද**
**077 8813197**

# අඹ යහළුවන් වූ ඩේවිඩ් හා පීටර්සන්

පළමුවන ලෝක සංග්‍රාමයේදී ප්‍රංශය හා එංගලන්තය අතර සටන් අති දරුණු ලෙස උග්‍රවී තිබුණේ ය. දෙරටේ ම යුධ ශක්තිය ප්‍රබලව පැවති නිසා යුද්ධය ජයගැනීමේ මහත් අසීරුකම දෙරටට ම දැනුණි. මේ නිසා හමුද බලය තර කිරීමේ අවශ්‍යතාවය අවබෝධ කර ගත් ඔවුන් වැඩි වැඩියෙන් හමුදාවට බඳවා ගැනීම් සිදු කළහ.

අවුරුදු 18 වැඩි සෑම තරුණයෙකුටම හමුදවේ නියමිත කාලයක් සේවය කළ යුතු බව හමුදා නීතියෙන් බල කෙරුණි. එක් වතාවක් හෝ යුධ සේවයෙහි යෙදුණු පුද්ගලයා එම වගකීමෙන් නිදහස් විය. එමෙන්ම යම් කෙනෙක් වෙනුවෙන් වෙනත් කෙනෙකුට හමුදාවේ නියමිත කාලය සේවය කර ඔහුව එම වගකීමෙන් නිදහස් කිරීමටද නීතියෙන් ඉඩක් ලැබුණි. මේ අනුව ඩේවිඩ් නම් 32 හැවිරිදි තරුණයාගේ වාරය පැමිණියේය. යුද්ධ ය කෙතරම් දරුණු ලෙස තිබුණිදැයි කිවහොත් යුද භටයින්ගේ ජීවිතය දැඩි අවදානමක පැවතුණි. ඩේවිඩ්ගේ මුහුණ මැලවී ශරීරය වැහැරී ගියේ ය. ඔහුගේ සිත බලවත් කම්පාවට පත්විය. දරුවන් සිවුදෙනා ඔහු වැළඳ ගත්තේ ය. ඔහු ඔවුන්ගේත් සිය බිරිඳගේත් අනාගතය ගැන සිතා දුක්වුණේ ය. ඔහුගේ සිතුවිලි ඔහු තුළ ව්‍යාකුල විය. මේ අතර ඔහුගේ මිතුරෙකු වු පීටර්සන් ඔහු මුණ ගැසීමට ආවේ ය.

පීටර්සන් වරක් හමුදාවේ තමාගේ වාරය නිම කළ කෙනෙකි. ඩේවිඩ් පිළිබඳව ඔහුගේ සිත අනුකම්පාවෙන් පිරුණි. අවසානයේදී ඩේවිඩ් වෙනුවට ඔහුගේ හමුදා සේවා කාලය ගෙවීමට පීටර්සන් ඉදිරිපත් විය. ”ඔබේ පවුල විශාලයි. ඔබේ වගකීම් විශාලයි. ඒ නිසා අවිවාහකයෙකු වන මා ඔබ වෙනුවෙන් ඉදිරිපත් වෙන්නම්” පීටර්සන් තම මිතුරා අස්වැසුවේ ය.

කලක් ගත විය. හදිස්සියේ හමුද සේවය සඳහා ඩේවිඩ් කැඳවනු ලැබීය. මහත් සේ පුදුමයට පත් වූ ඩේවිඩ් මෙය වැරදීමක් බවත් මීට වසරකට පමණ ඉහත දී තමා හමුද සේවයෙහි යෙදුණු බවත් එහිදි තමා මිය ගිය බවත් ඔහු කියා සිටියේය. තමා හමුද සේවයෙදී මිය ගියේ නම් දැන් ජීවත්ව සිටින්නේ කෙසේ දැයි හමුදා නිලධාරීහු ඔහුගෙන් ප්‍රශ්න කළහ. හමුදා වාර්තාවන් පෙරලා බැලුණි. මීට වසරකට පමණ පෙර ඩේවිඩ් යන අය වෙනුවෙන් පීටර්සන් නැමැත්තෙක් හමුද සේවයෙහි යෙදුණු බවත්, යුද්ධයේදී පීටර්සන් මිය ගිය බවත් හමුද වාර්තාවල සටහන්ව තිබුණි. ඩේවිඩ් වෙනුවෙන් ඔහුගේ වගකීම ඉටුකර පීටර්සන් මියගියේ

ය. ඩේවිඩ් වගකීමෙන් නිදහස් විය. ඩේවිඩ් වෙනුවෙන් පීටර්සන් තම ජීවිතය පරිත්‍යාග කළේය.

**"මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති " රෝම 3:23** ශුද්ධ වූ දෙවියන් වහන්සේ ඕනෑම මනුෂ්‍යයෙකු දකින්නේ පව්කරුවෙකු ලෙසය. අඩුවෙන් පව් කරන තැනැත්තාත් වැඩියෙන් පව් කරන තැනැත්තාත් දෙවියන්වහන්සේ ඉදිරියේ එක සමාන පව්කරුවන්ය. ප්‍රභේදයක් නැත. විශේෂත්වයක් නැත. මේ නිසා **"පාපයේ කුලිය නම් මරණයයි" (රෝම 6:23). "තවද එක් වරක් මරණයත් ඉන්පසු විනිශ්චයත් මනුෂ්‍යයාට නියමව තිබේ" (හේබ්‍රෙව් 9:27).** මනුෂ්‍යයෙකුට ඇත්තේ එක් මරණයක් පමණි. මරණින් පසු දෙවියන්වහන්සේගේ විනිශ්චය නියමව තිබේ. නැවත ඉපදීමක් නැත. මෙය දෙවියන්වහන්සේ විසින් නියම කර ඇති දෙයකි. මෙයට පටහැනිව ඇති මනුෂ්‍ය ඉගැන්වීම් හා න්‍යාය ධර්මයන් අප පිළිගත යුතුද? නැද්ද? එය ඔබගේ තේරීමයි. පාපයට දඬුවම තිබිය යුතු බැවින් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ එම දඬුවම ගෙවීම මුලු ලෝකයා වෙනුවෙන් ඉදිරිපත්වී වින්දසේක. ඩේවිඩ් වෙනුවෙන් පීටර්සන් ජීවිතය දුන් ආකාරයට ඔබ, මා වෙනුවෙන් යේසුස්වහන්සේ අපගේ දඬුවම වින්දසේක.

අප කුමන තත්වයේ සිටියත් අප කොතරම් යහපත් වැඩ කළත්, අප කොතරම් ආගමික නීති රීති පැවැත්තුවත් පාපයේ භයානක ආනිසංශ ඒවා වලින් ආවරණය කළ නොහැකිය. නුඹලා සියලු යහපත් ක්‍රියා කිලිටි වැරහැලි මෙන්" යයි ශුද්ධ වූ දෙවියන්වහන්සේ කියන සේක. මේ නිසා අප කරන සියලු ධර්මිෂ්ඨකම් හෝ යහපත් ක්‍රියා දෙවියන්වහන්සේ දකින්නේ කිසිත් කමකට නැති කිලිටි වැරහැලි මෙනි. ගණිතමය සමීකරණයක් මෙන් අධර්මිෂ්ඨකම් ධාර්මික ක්‍රියාවලින් සමතුලිත කිරීමට උත්සහ කිරීම දෙවියන් වහන්සේ ඉදිරියේ කිසිත් නැති නිෂ්ඵල උත්සාහයකි.

**"එහෙත් දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්ව න්නේ අප පව්කාරයන්ව සිටියදීම ක්‍රිස්තුස්වහන්සේ අප වෙනුවෙන් මරණය විඳීමෙනි" (රෝම 5.8).**

උපතින්ම පව්කරුවන් වු අප උපතින්ම එම දඬුවමට බැඳී සිටිමු. දෙවියන්වහන්සේ විසින් නියම කළ දඬුවමින් ගැලවිය හැක්කේ කාටද? එහෙත් දෙවියන් වහන්සේ අපට අතිශයින්ම ප්‍රේම කළසේක. පාපය නොදන්නා වු පව් නොකළා වු ක්‍රිස්තුස් යේසුස්වහන්සේ අප උදෙසා පාපය වීමටත්, අපගේ පාපයෙන් හා සදාකාල දඬුවමින් අප ගලවා ගැනීමටත් ප්‍රේමයෙන් ඉදිරිපත් වු සේක. එදා කුරුසියේ මරණය තුළින් දෙවියන්වහන්සේගේ පුත්‍රයාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නිම කලේ එම මහත් කර්තව්‍යය යි. "එය නිමයි" යේසුස් වහන්සේ ලොවටම හඬගා ප්‍රකාශ කළ සේක. ඩේවිඩ් වෙනුවෙන් පීටර්සන් ඉදිරිපත්වී ඩෙවිඩ් ඔහුගේ වගකීමෙන් නිදහස් කළේය. දෙවියන්වහන්සේ

ඉදිරියේ අද අපිට නිදහස්කම තිබේ. අප වෙනුවෙන් යේසුස්වහන්සේ ඉදිරිපත් වී අපගේ පාපයේ දඬුවම ගෙවූ සේක.



<u>ඔබ දේව දරුවෙකු වන්නේ කෙසේද?</u>

01. දෙවියන්වහන්සේ කියන පරිදි ඔබ පව්කරුවෙකු බව පිළිගන්න. ඔබගේ ආගමින් ඔබට දෙවියන්වහන්සේ ප්‍රසන්න කළ නොහැකි ය. ආගම පැවැත්වීමට උත්සහ කිරීමෙන් ඔබ ඔබගේම යහපත් ක්‍රියාවලින් දෙවියන්වහන්සේ ප්‍රසන්න කිරීමට උත්සාහ නොකරන්න. දෙවියන්වහන්සේ ඉදිරියේ ඔබ තවත් පව් කරුවෙකු බව පිළිගන්න. උපන්දා පටන් ඔබ කර ඇති පව් සිහි කරන්න. ඒ ගැන සිතා අවංකවම දුක්වන්න පසුතැවිලි වන්න.

02. ඔබේ පාපයට දඬුවම සදකාල මරණය යි. එය නියම කළේ දෙවියන් වහන්සේ ය. ඉන් ගැලවීමට මනුෂ්‍යයා විසින් නිර්මාණය කරගත් දර්ශන, ආගම් න්‍යායයන් වලින් බැරිය. එකම මාර්ගය දෙවියන්වහන්සේ විසින් සැලසුම් කළ ගැලවීමේ මාර්ගය වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ය.

03. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබේම ස්ථානය ගෙන කුරුසියේ මැරුණු සේක. උන්වහන්සේ ගෙව්වේ ඔබේ පාපයේ දඬුවමයි. මෙය ඔබ දෙවියන්වහන්සේ ඉදිරිපිටදී යටහත් පහත්ව විශ්වාස කරන්න, අදහන්න. එවිට ඔබට පාපයේ වහල්කමෙන් හා පාපයේ දඬුවමින් නිදහස්වීමට දෙවියන්වහන්සේ අනුග්‍රහය දෙනසේක.

04. පව් ඒත්තුගත් ඔබ දෙවියන්වහන්සේ ඉදිරියට ගොස් මෙසේ යාච්ඤා කරන්න. **"ස්වාමිනී, මම පව්කරුවෙක්. මා තුළ කිසි හොඳක් නැත. එහෙත් ඔබවහන්සේගේ පුත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මා වෙනුවෙන් කුරුසියේ මැරී මාගේ පාපයේ දඬුවම ගෙවූ බව දැන් මම පිළිගනිමි. උන්වහන්සේ හැලූ ලේ වලින් මාගේ පව් සෝදා හැරිය මැනව. අද පටන් ඔබ වහන්සේ මා තුළට ඇවිත් වාසය කළ මැනව".**

05. එම යාච්ඤාව ඔබ මුළු සිතෙන් අවංකව කළා නම් මේ මොහොතේ පටන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබ තුළට ඇවිත් වාසය කරනසේක. ඔබ දෙවියන් වහන්සේගේ දරුවකු බවට පත් වී ඇත. **(යොහාන් 1:12)** ඔබ අලුත් මැවිල්ලක් වන්නේය. දෙවියන්වහන්සේට ප්‍රසංශා වේවා.

**- ජීවන හඬ -**

# ලත් පමණින් සතුටුවීම

'ලත් පමණින් සතුටුවීම' යන ආත්මික අභියෝගය හමුවන්නේ **1 තිමෝති 6:6 පදයෙනි.** පාවුල්තුමා තිමෝති නැමැති තරුණ දේව සේවකයාට දුන් ගුරුහරුකම් **1 වන හා 2 වන තිමෝති** යන ලිපිවල අන්තර්ගත වේ. පාවුල්තුමා මෙම ලිපි ලියුවේ රෝම නගරයේ සිටයි. සුළු ආසියාවේ (අද තුර්කිය) පළාත් සභාවක් භාරව සිටි තිමෝති හමුවීමට අවස්ථාවක් නොලත් හෙයින් මෙම ලිපි මගින් අවශ්‍ය උපදේශ යැවිණි. ක්‍රි.ව. 65 දී පමණ මේවා ලියා ඇති බව සිතති. මෙම කාලය වන විට පාවුල්තුමා මහලුව සිට ඇත. එනිසා තරුණ තිමෝති දේව වචනයෙන් පූර්ණ කිරීමට අත්‍යාවශ්‍ය විය.

**"ලත් පමණින් සතුටුවීම සමග භකිත්වන්තකම මහත් ලාභයක්මය" (1 තිමෝති 6:6).** මෙම පාඨයේ අඩංගු කරුණු කොටස් කළ හැකිය. ලත් පමණින් සතුටු වීම. ඒ සමගම භක්තිවන්තකම ඇතිකර ගැනීම, එය ලාභයක්සේ සැලකිය යුතුවීම යනුවෙන් ඒවා කොටස් කර දැක්විය හැක.

තරුණ සිත නොයෙක් ආශාවන්ගෙන් පිරී පවතී. විශේෂයෙන් තරුණ සිත් පොළඹවන නොයෙක් නිෂ්පාදනවලින් වෙළඳපොළ පිරීයයි. මහත් පරීක්ෂා සෝදිසි කිරීම් එවිට මතුවේ. ජීවත්වීම පහසු කරනු ලබන විවිධ ද්‍රව්‍යාකාර දේවල් වෙළඳපොළ ආක්‍රමණය කරයි. ජන සංනිවේදන මාධ්‍ය මගින් රවටනු ලබන මනුෂ්‍යයා විවිධ ද්‍රව්‍ය මිලදී ගැනීමේලා උත්සුක වේ. තමන් වෙහෙස මහන්සියෙන් උපයාගත් මුදල් විවිධ මාදිලියේ ද්‍රව්‍ය උපකරණ අත්පත් කර ගැනීමට යෙදවේ. ඇතැම්විට ණය වෙති. අතමිට, සරු අය අත දිගහැර වියදම් කරති. තමන්ට රිසි දේ ලබා ගැනීමට නොහැකිව ලතැවෙන අයද ඇත. මෙයින් ලෞකික සිතෙහි ස්වභාවය අපට පැහැදිලි වේ. ක්‍රිස්තුස් යේසුස්වහන්සේට ඇර නොදුන් සිත ලෝකයටම ඇලුම් කරයි. **"ලෝකය සමග මිත්‍රකම දෙවියන්වහන්සේට සතුරුකම බව නුඹලා දන්නේ නැද්ද?" (යාකොබ් 4:4).**

"අනුකරණය" යන අදහසද මනුෂ්‍යයාගේ ආශාවන් වර්ධනයට හේතුවේ. ලද පමණින් සතුටුවීමට උත්සාහ දරන අතරතුර තමන්ට දක්නට ලැබෙන නොයෙක් දේ ගැන තෘෂ්ණා පහල විය හැකිය. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට භාර නොදුන් සිතට එවන් ආශාවලින් නිදහස්විය නොහැක. ක්‍රිස්තුස්වහන්සේට සිත භාර දී ඇතිවිට අනුකරණයෙන් බාධා නොපැමිණේ. පාවුල්තුමා ශුද්ධවූ ලියවිල්ලෙහි මෙසේ පවසයි, **"මාගේ ජීවත්වීම නම් ක්‍රිස්තුස්වහන්සේ උදෙසාය, මරණයද මට ලාභයක්ය" (පිලිප්පි 1:21).** ක්‍රිස්තුස්වහන්සේ ගැළවුම්කරු ලෙස සිතට පිළිගත් මොහොතේ ඇදහිලිවන්තයා ජීවත්වන්නේ ක්‍රිස්තුස් වහන්සේ උදෙසාය. නොහොත් තවදුරටත් තමා නොව ජීවත්වන්නේ තමා තුළ ක්‍රිස්තුස්වහන්සේය. එදිනෙදා

ජීවිතයට අවශ්‍ය දේ ගැන සිත යොමු කරමින් කනස්සලු වේනම්, එතෙක් සිතේ රජයන්නේ තම කම බව පැහැදිලි වේ. ක්‍රිස්තුස්වහන්සේ අප වෙනුවෙන් දිළිඳු වූ ආකාරය සිතේ තබා ගනිමු.

සිත තුළ ගොඩනංවා ගත යුතු ගුණාංගයක් පාවුල්තුමා පෙන්වයි. ඒ දේවභක්තියයි. ලත්පමණින් සතුටුවීම සමඟ දේවභක්තිය තිබිය යුතුය. දේවභක්තිය ඇති විට ලත්පමණින් සතුටු විය හැකිය. මනුෂ්‍ය ගුණධර්මයක් වශයෙන් ලද පමණින් සතුටුවීමේ ආකල්පය දියුණු කිරීම පව්කාර මනුෂ්‍යයාට නුපුළුවන. දෙවියන්වහන්සේ කෙරෙහි භක්තිය ඇති වන්නේ උන්වහන්සේට මුළු සිතින් ප්‍රේමකිරීම තුළිනි. **"ලෝකයටවත්, ලෝකයෙහි තිබෙන දේවලටවත් ප්‍රේම නොකරල්ලා"** යනුවෙන් බයිබලය පෙන්වා දෙයි (**1 යොහන් 2:15**). ලෝකයට ප්‍රේමකරන්නා තුළ දෙවියන්වහන්සේ කෙරෙහි භක්තිවන්තකම නැත. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සිතට පිළිග න්නා මොහොතේ ලෝකයේ බැඳීමෙන් නිදහස්වේ, පාපයෙන් නිදහස්වේ, ගැලවීම උරුමවේ. එවිට මුල් සභාවේ තිබූ ආකාරයට සභාව තුළ බෙදා හදා ගැනීමේ ප්‍රතිපත්තිය ගොඩනැගී, හැම කෙනෙකුට හිඟයක් නොමැතිවනසේ සැපයෙන පරිදි දෙවියන්වහන්සේගේ ක්‍රියාකාරිත්වය විද්‍යාමානවේ. **"හිඟ ඇති කිසිවෙක් ඔවුන් අතරෙහි නොවීය"** (**ක්‍රියා 4:34**).

සිතෙහි තණ්හා ආශා බහාලමින් මනුෂ්‍යයා පාපයට අදින්නෝ කවුරුන්ද? **"නුඹලාගේ විරුද්ධ කාරයාවූ යක්ෂයා ගොරවන සිංහයකු මෙන් කවරෙකු ගිලිම්දෝ හෝයි සොයමින් ඔබ මොබ ඇවිදින්නේය"** (**1 පේත්‍රුස් 5:8**). ඇදහිලිවන්තයා කෙරෙහි බලය පාන්නට යක්ෂයාට නොහැකිව ඇත. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යක්ෂයා පරාජය කර ඇති හෙයින් යක්ෂයාට විරුද්ධව සිටීමේ බලය ඇදහිලිවන්තයාට ලැබී ඇත. " **එබැවින් ... අප අසු කරන පාපයද අහක දමා.. යේසුස්වහන්සේ දෙස බලමින් අප ඉදිරියෙහි තබා තිබෙන දිවීම ඉවසිල්ලෙන් දුවමු"** (**හෙබ්‍රෙව් 12:1**).

ලද පමණින් සතුටුවන අතරම දේවභක්ති ය ගොඩනංවා ගැනීම අනිවාර්යයෙන් කළ යුතුය. අපගේ අවශ්‍යතා පිළිබඳව දෙවියන්වහන්සේට යාච්ඤා කළ යුතු බව බයිබලය පැහැදිලිව පෙන්වා දෙයි. එම නිසා නොලද දේ ගැන කනස්සලුවන්නට අවශ්‍යතාවක් නොවේ. පාවුල් තුමා පවසන මේ වදන් අපව ශක්තිමත් කරයි, **"මාගේ ස්වාමිවූ ක්‍රිස්තුස්වහන්සේ ඇඳින ගැනීමේ උතුම්කම නිසා සියල්ල අලාභයයි සලකමි"** (**පිලිප්පි 3:8**). ඔබ ඒ උතුම්කම සෙවීමෙහි පංගුකාරව සිටින්නෙහිද?

මෙතෙක් දැක්වූ කරුණු අනුව ලද පමණින් සතුටුවීම නමැති ලක්ෂණය සාක්ෂාත් කරගත හැක්කේ ගැළවීම ලැබීම සමඟ බව පැහැදිලි වේ. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ප්‍රේම කිරීමෙන්, සිත්සතන්හි ජනිතවන දේවභක්තියද සමඟ, එම ගුණාංගය අපව ඇදහිල්ලෙහි ඉදිරියට ගෙනයනු ඇත.

**- ගුරුහරු -**




# යෝධ වැඩ කළ යෝතාම් රජ

ගිඩියොන්ගේ පුත්‍රයන් සැත්තෑ දෙනා අතරින් එක් අයෙක් වූ යෝතාම්. **විනිශ්චයකාරයන්ගේ පොතෙහි 9 වෙනි පරිච්ඡේදයේ 5 සිට 57 දක්වා** අපට හමුවෙයි. ඒ එක් අයෙකි. යුදාගේ ගෝත්‍රයේ මිනිසෙක් වූ යෝතාම්, තවත් අයෙකි. ඔහු පිළිබඳව **1 ලේකම් 2:47** අපි කියවමු. එහෙත් උස්සියා රජුගේ පුත්‍රවූ යෝතාම් පිළිබඳව පසුගිය ලිපියෙහි අප ඉගෙන ගත්තෙමු. මේ යෝතාම් නම දරණ තිදෙනා ජීවත් වූ වකවානු එකිනෙකාට වෙනස් වේ. ඔවුන්ගේ ක්‍රියාකාරකම්ද විවිධය. යෝතාම් යන නමේ තේරුම " යෙහෝවාවහන්සේ පිරිපුන්ය" යන්නය. අප මෙහිදී අධ්‍යයනය කරන යෝතාම් රජ යුදාහි රජවූ උස්සියාගේ පුත්‍රයා ය. උස්සියා රජකමෙහි හිටියදීම රෝගාතුර වූවිට ඔහුගේ පාලන තන්ත්‍රයේ මෙහෙයවීම කළේ මෙම යෝතාම්ය. පස් වසරක් මුළුල්ලේ යෝතාම් විසින් පිය රජුගේ පාලනයෙහි වැඩ බැලූ පාලකයා විය. එවිට ඔහුට වයස වූයේ විසිවසරක් පමණය. ඔහුගේ මවගේ නම **2 ලේකම් 27:1** අනුව යෙරූෂාය. ඇය ශාදොක්ගේ දුවණියකි.



## යෙසායාගේ දූතනය

උස්සියා රජ නැසුන අවුරුද්ද අනාගතවක්තෘ යෙසායා දේව මෙහෙවරට කැඳවූ කාලසීමාව වෙයි. **(යෙසායා 6:1)** මෙහිදී යුව රජකමේ සිටි යෝතාම් යුදාහි රජ ලෙස තෝරා ගනු ලැබීය. ඒ වන විට පුරා පස්වසරක පළ පුරුද්දක් ලැබ සිටි යෝතාම් රජකම තහවුරු වූ හැටියේම සිය දක්ෂ පාලනය සිව්දිගට විහිදුවා හැරීමට සමත් විය.

ඇදහිලිවන්තයා ස්වාමීවූ යේසුස්

ක්‍රිස්තුස්වහන්සේ අදහාගත් පසුව ක්‍රමයෙන් ක්‍රිස්තු ස්වරූපයට මාරුවීම අරඹයි. ඔහු එක්වරම දේවවචනයෙහි ඵල දරන්නේ නැත. එසේම එකම ස්ථානයක නතරව සිටින්නේද නැත. **ගලාති 4:19** පරිදි යේසුස්වහන්සේ ඇදහිලිවන්තයා තුළ සම්පූර්ණත්වයට පැමිණ වීම දේව කැමැත්තය. "සම්පූර්ණව සිටපල්ලා" යයි (**2 කොරින්ති 7:1, එපීස 4:10**) දේව වචනය දක්වයි. සම්පූර්ණත්වය කරා ක්‍රමයෙන් එළඹෙන විට විවිධ ආකාරයේ අත්දැකීම් අපගේ ජීවිතවලට ඇතුළත් වීමට ස්වාමීන්වහන්සේ ඉඩ හරින සේක. ඒවා ගිනිමය පීඩා බඳු අම්හිරි අත්දැකීම් වන්නට බැරි නැත. (**1 පේතෘස් 1:3 සිට 9 දක්වා පද**) අත්දැකීම් රහිත රජකුගේ පාලනය ගිලිහීයාම සීඝ්‍ර වෙයි. පුහුණුවත් ප්‍රායෝගික අත්දැකීම් වර්ධනය ඕනෑම ඇදහිලිවන්තයකුට අවශ්‍ය වේ. වඩාත් හොඳ රත්රන් නිකුත්වන්නේ වඩාත් උණුවන කෝවයකින් බව අමතක නොකරමු. **පිලිප්පි 3:8** අනුව ස්වර්ගීය නාගරිකත්වයට පුරවැසි වූ ජනතාවක් ඊට ආත්මයෙන් හුරුකරවීම සඳහා ශාරීරික හෝ මාංශික තෘෂ්ණාවන්ගෙන් මුදාලනු ලැබීමේ දිව්‍ය සැලසුම් ක්‍රියාත්මක වනවිට අසීරුතා හටගැන්ම අස්වාභාවික නොවනු ඇත. යෝතාම්ද මේ නීරස හා කටුක උමග හරහා ගියේ ය. දාවිත්, යෝසෙප්, ගිඩියොන් පමණක් නොව ස්වාමීවූ යේසුස්වහන්සේ ද, සියලු ප්‍රේරිතයන්ද, ප්‍රොපේතවරුන්ද කටුක උමග හරහා ගිය අධ්‍යාත්මික ප්‍රතිශක්තියේ ආදර්ශයන්ය. එබඳු අත්දැකීම් රහිත බයිබලීය චරිත ඉතාම දුර්ලභය. ඉතින්, යෝතාම් මෙන් ඔබටත් පුහුණුවේ - පරීක්ෂාවේ - සෝදිසි කිරීමේ - වර්ධනය කිරීමේ - රැඳී සිටීමේ - බලා සිටීමේ - ඉවසීමේ කාලයක් පැමිණිය හැකිය. රජකම ස්ථාවර වූ පරිණත බුද්ධිමය සදාකාල රජකමක් වෙනුවෙන් නොකොඳුරන්න. දෙවියන්වහන්සේගේ කැමැත්ත සොයන්න. අධෛර්‍යමත් නොවන්න.



## <u>රජකම තහවුරුවීම</u>

රජගෙදර ප්‍රධානියා (**2 ලේකම් 26:21**) රජකමට පත්විය. එවිට ඔහුට විසිපස් වසරක් විය. මෙම කීර්තිමත් රජු එතැන් සිට දහසය වසරක් මුළුල්ලේ දෙවිවූ ස්වාමීන්වහන්සේගේ අඩිපාරේ යමින් උන්වහන්සේගේ ඇස් හමුයෙහි හරිව තිබුණු දේ කළේය. ඔහු කළ වරදක්

ලෙස අප අධ්‍යයනය කරන්නේ යෝතාම් දේවමාළිගයට ඇතුල් නොවූ බවය. ඔහුගේ පියා දේවමාලිගයට ගොස් කළ පාපය නිසා ඊට ලැබූ අනිටු විපාකය යෝතාම්ව මේ තත්වයට පත්කළා විය හැකිය. ක්‍රි. පූ. 742 දක්වා ඔහු රාජ්‍ය කළ බව ඇතැම් පොත් වල දැක්වේ. සියොන් (යෙරුසලම්) කන්දේ උතුරු කෙළවර හෙවත් දේව මාළිගය හා සියොන් කන්ද අතර වූ ස්ථානය "ඕපෙල්" නම් විය. රජු දේව ගෘහයේ ඉහළ දොරක් ඕපෙල්වුහී පවුරේ වාසස්ථානය හා ආරක්ෂාවත් අලංකාරයත් එකවිටම සිදුවූ බව පෙනේ. සත්‍යවාදී ඇදහිලිවන්තයා සභාවේ ආත්මික ප්‍රතිපත්තීන් සපුරා ජීවිතයේ ක්‍රියාවට නැගීමෙන් සභාව ආරක්ෂා කිරීමට උනන්දුවන අතරම තමාගේ ආත්මික ජීවිතයද එමගින් හැඩවැඩ කර ගනී.

යුදාහි කඳුකර ප්‍රදේශවල **(යෝෂුවා 15 බලන්න)** චමත්කාරය දනවන නව නගරද කැළෑ-මූකලාන පෙදෙස් ආරක්ෂා කොට බල කොටුත් මුර කොටුත් තනා සතුරු උපද්‍රව ගැන නිතර අවදියෙන් සිට, ස්වකීය ජනතාවගේ සුරක්ෂිතභාවය තහවුරුකිරීම් යෝතම්ගේ යෝධ මෙහෙවරට අයත් විය. සභාව ආරක්ෂා කිරීමෙහි රිසිවන ඇදහිලිවන්තයා තමාගේම ආත්මය නිරතුරු රැකබලා ගනී. යෝතාම්ද යුදා රට රැකීමට දේව කරුණාව සෙවූ බව ශු. බයිබලය කරුණු දක්වයි **(2 ලේකම් 27:6)**.

# සුවඳ දුම් පිදීමේ පල

යෝතාම් අම්මොන් පුත්‍රයන්ගේ රජුට විරුද්ධව යුද්ධ කොට ජයගෙන පුරා තුන් වසරක් කප්පම් ගෙන්වා ගත් අයුරු **2ලේකම් 27:5** දැක්වේ. යෝතාම්ගේ මරණය ස්වභාවික එකක් වූ බව පෙනේ. ඔහු යෙරුසලමේ රජුන්ට අයත් කොටසෙහි තැන්පත් කරන ලදී. යෝතාම්ගේ කාලයේ සිරියේ රජ වූ රෙශින්ද පෙකානම් අයද යුදාට විරුද්ධව සටන් වැදුණ බව **2 රාජාවලිය 15:37** පෙන්වයි. එයට හේතුවූයේ යුදාවරු මිත්‍යා විශ්වාසය අතහැර නොදමා උස්තැන්වල බොරු දෙවිවරුන්ට යාග පිදීමත්, සුවඳ දුම් දැවීමත්ය. යෝතාම්ගේ සාරවත් රජකමේ අවසානයේදී ඔහුගේ පුත්‍ර ආහාස් රජකමින් පිදුම් ලැබීය.

**- ප්‍රන්සිස් විජයසිංහ -**



# ස්වාමීන්වහන්සේ මාගේ එඬේරාය
# The LORD is my SHEPHERD



බොහෝ දෙනෙකුගේ ප්‍රියතම පදයක් වන **ගීතාවලිය 23:1** බොහෝ දෙනාගේ සිත්තුළ ඉතා නිරායාසයෙන් සහ පහසුවෙන් මතකයේ රැඳී පවතින්නේ "එඬේරාය" යන කරුණයි. "ස්වාමීන්වහන්සේ මාගේ එඬේරාය ඒ නිසා උන්වහන්සේ විසින් මට එම පරිච්ඡේදය පුරා සඳහන් වී ඇති දේවල් සපයන සේක. සපයා දිය "යුතුය". අපට වෙන දෙවිවරුන් නැත. ඒ නිසා අප දන්නාවූ එකම දෙවියන්වහන්සේ අපට සපයා දිය යුතුය". සෘජුවම හෝ වචනයෙන් නොකීවත්, මෙය තමයි සෑම ඇදහිලිවන්තයාගේම සිතෙහි නැතිනම් යටි සිතෙහි (Subconscience) දෙවියන්වහන්සේ සහ තමන් අතර තිබිය යුතු සම්බන්ධතාවය පිළිබඳ නිර්වචනය. මෙම අයිතිය හෝ ලැබිය යුතු උරුමය පිළිබඳ හිතැගිය (Sense of entitlement) පිළිබඳ සාවද්‍යය සංකල්පයක් සෑම කෙනෙකුගේම සිතේ පවතී. ගැඹුරු ලෙස මෙය විග්‍රහ කරන්නේ නම් මෙය මනුෂ්‍යයාගේ කැරලිකාරකම (Rebelliousness) නිරූපනය කරයි.

"එඬේරා" යන පදයට පෙර අප සැලකිය යුත්තේ "ස්වාමීන්වහන්සේ" යන්නයි. එහෙත් බොහෝ අය තුළ "ස්වාමීන්" ගැන තිබෙන්නේ අඩු සැලකිල්ලකි, එසේත් නැත්නම් සම්පූර්ණ නොසැලකිල්ලකි, නැතහොත් අකමැති, අප්‍රසන්නභාවයකි. එඬේරා නමුත් ස්වාමීන්වහන්සේ නොවේ. "ස්වාමීන්වහන්සේ මාගේ එඬේරාය" යනු දෙවියන්වහන්සේ සහ ඇදහිලිවන්තයා අතර තිබෙන සදාකාලික "ගිවිසුම"ට අදාල දෙයකි.

මාගේ එඬේරා වීමට නම් ඊට ප්‍රථමයෙන් දෙවියන්වහන්සේ මාගේ ස්වාමීන් වහන්සේ විය යුතුය.

★ යේසුස්වහන්සේ මාගේ ස්වාමීන් වහන්සේ වන තාක් කල් උන්වහන්සේ මාගේ එඬේරාය. (As long as Jesus is my Lord He is my shepherd).

★ යේසුස්වහන්සේ මාගේ එඬේරා වන්නේ උන්වහන්සේ මාගේ ස්වාමීන්වහන්සේ නිසාය. (Jesus is my Shepherd because He is my Lord).

අප විසින් සැලකිල්ලට ගතයුතු එකම කරුණ වන්නේ "යේසුස්වහන්සේ මාගේ ස්වාමීන්වහන්සේද" (Is Jesus really my Lord) යන්න පමණකි. ස්වාමීන්වහන්සේ මාගේ එඬේරාද යන පැනය අපට අයිති දෙයක් හෝ අප විසින් කරදර විය යුතු කරුණක් නොවේ. මන්ද එය දෙවියන්වහන්සේට පමණක් අයිති කරුණකි. අප මේ දේවල් දෙකේ පැති මාරු කරගෙන සිටිමු. අපගේ පාර්ශවයෙන් සිදුවිය යුතු එකම දෙය යේසුස්වහන්සේ මාගේ ස්වාමීන්වහන්සේද නැද්ද යන ප්‍රශ්නය ගැන අවංක ලෙස අවධානය යොමු කිරීමයි. නමුත් සිදුවන්නේ එය නොව අප දෙවියන්වහන්සේට පමණක් අයිති වගකීම ගැන සිතමින්, එය සිදුවන්නේ කෙසේද? එය සිදුවිය යුත්තේ කෙසේද? එය හරියට සිදුවෙනවාද? එය සිදුවිය යුතු ප්‍රමාණයට සිදුවෙනවාද? ඇයි එය මේ ආකාරයට හෝ අර ආකාරයට හෝ සිදුනොවන්නේ, ඇයි එය තව කෙනෙකුට මට වඩා හොඳින් සිදුවන්නේ.... මේවා ඇදහිලිවන්තයාට අයිති නැති දෙවියන්වහන්සේගේ පරමාධිපත්‍යයට පමණක් අයිති කාරණාය. ස්වාමීන්වහන්සේගේ ගිවිසුම රක්ෂා කිරීමට උන්වහන්සේ දන්නා සේක. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ගිවිසුමට විශ්වාස වන්තව සිටින සේක. යේසුස්වහන්සේගේ ලේ වලින් එම ගිවිසුම පිහිටුවා ශුද්ධාත්මයාණන් විසින් එය සදාකාලිකව මුද්‍රා කර තිබේ.

ඊශ්‍රායෙල් ජනතාව මිසරයෙන් මුදා පිටතට ගෙනාවිට, "ස්තූතියි ස්වාමිනි, ඉතුරු ටික අපි බලාගන්නම්, ඔබවහන්සේ අපේ අතේ දුරින් ඉන්න, අවශ්‍ය වුනොත් කතා කරන්නම්" මෙය තමයි ඔවුන්ට අවශ්‍ය වුණේ. මෙය තමයි මිසරයේදීත් ඔවුන් වටකර සිටින සියලු අන්‍යාග මික ජාතීන් අතරත් සිදුවූයේ. ඔවුන්ගේ දෙවිවරුවූයේ තමන්ගේ සුවපහසු දෙවිවරු (gods of convenience) සහ තම ජාතික අනන්‍යතාවයේ ප්‍රෞඩත්වය පිළිබිඹු කරන සංකේතයක් (Symbol of prestige) කිරීමට පමණි. මෙය එදා මෙදා තුර මනුෂ්‍ය සංහතිය තුළ කිසිම අඩුවක් නැතිව සිදුවන දෙයකි. දෙවියන්වහන්සේ වුවත් අපගේ ස්වාධීනත්වයට ඇඟිලි නොගැසිය යුතුය. සමලිංගිකත්වය, ගබ්සාව, ලිංගි ක අනන්‍යතාවයෙහි අර්ථකතනය, තමන් කැමති ආගමික විශ්වාසයන් නිර්වචනය කිරීමේ පරිපූර්ණ අයිතිය යනාදී වශයෙන් මනුෂ්‍යයා සම්බන්ධ සියලුම කාරණා වලදී දෙවියන්වහන්සේ මැදිහත් නොවිය යුතුය. (God should not intervene or interfere with our affairs). මෙය දෙවියන්වහන්සේව



සිංහාසනයෙන් බිම හෙලා මනුෂ්‍යයා දේවත්වයට පත් කිරීමට (Dethrone God and deify man) ඒදම් උයනෙන් ආරම්භ වූ කතා වස්තුවයි (Epic Story). මෙය ලෞකික මානවවාදයයි. (Secular humanism). දෙවියන්වහන්සේ නොව එසේත් නැත්නම් දෙවියන්වහන්සේ මෙන්ම මනුෂ්‍යාද උත්තරීතරවේ. (Man is as supreme as, if not supreme above, God).

එහෙත් දෙවියන්වහන්සේ කීවේ කුමක්ද? **"නුඹලා මා පිටතට ගෙන ආවේ මා වෙතටය, එනම් මටය" (නික්මයාම 19:4). (I brought you to myself).** මා ඔවුන් මිසරයෙන් පිටතට ගෙනාවේ ඔවුන් අතර වාසය කරන පිණිසයි. මම ඔවුන්ගේ දෙවිවූ ස්වාමීන්වහන්සේය. **(නික්මයාම 29:46).** (I brought them out of Egypt is that I might dwell among them. I am the LORD their God).

**ඊශ්‍රායෙල් සදාකාලයටම ඔබට සෙනඟක් කොට තබාගෙන, ඔබම, ස්වාමීන්වහන්ස, ඔවුන්ගේ දෙවියන්වහන්සේ වී සිටිනසේක. (1 ලේකම් 17:22).**

ආරම්භයේදී පටන්ම මුළු ඉතිහාසය පුරාම ඊශ්‍රායෙල් ජාතිය සෑමවිටම උත්සාහ කළේ දෙවියන්වහන්සේගේ පාලනයෙන් මිදීමටය. ඊශ්‍රායෙල් ජාතිය පමණක් නොවේ, මුළු මනුෂ්‍යය සංහතිය තුළම මෙම නෛසර්ගික ජන්ම ආශාව සිත තුළ කැකෑරෙමින් පවතී. (Intrinsically innate desire screaming in the heart of entire mankind). දෙවියන්වහන්සේ මාගේ ස්වාමීන්වහන්සේ නොවේ. මාගේ ස්වාමීන්වහන්සේ මමම ය. මෙසේ සිතීමට මිනිසා පෙළඹී ඇත.

යමෙක් කුඩා දරුවන් පිරිසකට එක්තරා පින්තූරයක් පෙන්වා පැනයක් ඇසුවා. එහි තිබුණේ සිතක් පිළිබිඹු කරන රූපයක් ඇතුලේ දේවල් සතරක්ය. ඉහළ කොටසේ යේසුස්වහන්සේ සහ මිනිසෙක්ද පහළ කොටසේ සිංහාසනයක් සහ කුරුසියක්ය. ගුරුවරයා ළමයින්ට කීවා, යේසුස්වහන්සේ සහ මනුෂ්‍යාව අරගෙන පහල තිබූ සිංහාසනය සහ කුරුසිය මත තබන්න. කිසිම අපහසුවකින් තොරව ළමයින් එම කාර්යය කර තිබුණි. යේසුස්වහන්සේ කුරුසියේ සහ මිනිසා සිංහාසනයේය.

මෙය තමයි ඇදහිලිවන්තයා පිළිබඳ එදා සිට අද දක්වාම අනුප්‍රාප්තික ලෙස සිදුවන යතාර්ථය.

★ යේසුස්වහන්සේ - තවම කුරුසියේය (God is dethroned) එනම් උන්වහන්සේ සිංහාසනයෙන් බිම හෙලා ඇත.

★ මම - තවමත් සිංහාසනයේය. එනම් මම මගේ ජීවිතේ දෙවියා බවට පත් වී ඇත. (I am defined).

ස්වාමීන්වහන්සේ මාගේ එඬේරාය. එය එසේනම් ස්වාමීන්වහන්සේ මා සිතතුළ සිංහාසනාරූඪව සිටිය යුතුය. එසේ කිරීමට ඔබටත් මටත් ශුද්ධාත්මයාණන්වහන්සේ උපකාර කරන සේක්වා!

- මතු සම්බන්ධයි -

**- ඇලෙක්ස් පෙරේරා -**

# කිතුණු පවුලක් ගොඩ නගමු



★ **"පුරුෂයෙනි, ක්‍රිස්තුස්වහන්සේ සභාවට ප්‍රේමකොට, ඈ උදෙසා තමන්ම පාවාදුන්නාක්මෙන්ම නුඹලාත් නුඹලාගේ භාර්යාවන්ට ප්‍රේමකරපල්ලා" (එපීස 5:25).**

★ **"භාර්යාවනි, ස්වාමීන්වහන්සේට මෙන් නුඹලාගේ පුරුෂයන්ට යටත්ව සිටපල්ලා. මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ සභාවේ හිසව සිටින්නාසේම පුරුෂයාත් භාර්යාවගේ හිසව සිටියි" (එපීස 5:22).**

★ **"දරුවෙනි, නුඹලාගේ දෙමවුපියන්ට ස්වාමීන්වහන්සේ තුළ කීකරුවෙයල්ලා. මක්නිසාද එසේ කරන්ට යුතුය. නුඹට වැඩසිද්ධවන පිණිසද නුඹ පොළොවෙහි බොහෝ කල් ජීවත්වන පිණිසද, නුඹේ පියාටත් මවුටත් ගෞරවකරපන්න" (එපීස 6:1).**

කිතුණු පවුලක් ගොඩනැගීමේදී අප හට අනුගමනය කළහැකි බයිබලීය මූලික ප්‍රතිපත්ති තුනක් ඉහත සඳහන් වේ.

දෙවියන්වහන්සේගේ දරුවන් වන අපට තිබෙන අනර්ඝතම මඟපෙන්වන පොත වන්නේ බයිබලයයි. එහි කතෘවන්නේ දෙවියන්වහන්සේය. එහි ප්‍රතිපත්ති අනුගමනය කරන විට අප හට නිවැරදි වූත්, සත්‍යය වූත් ජීවිතයක් ගත කළ හැක. අපගේ පවුල් ජීවිතය ගොඩනැගී මේදී බයිබලීය ප්‍රතිපත්ති අනුගමනය කිරීම මගින් යහපත් පවුලක් ගොඩනැගි ය හැකිය. එවැනි ආදර්ශ බොහොමයක් අතීතයේ මෙන්ම වර්ථමානයේ ද දක්නට ඇත.

## <u>පියාගේ වගකීම.</u>

කිතුණු පවුලක් ගොඩ නැගීමේදී එහි ප්‍රධාන සාධකයක් වන්නේ ගෙදර පියාය. ඔහු හැසිරෙන ආකාරය මත මුළු පවුලේ සතුට සහ දියුණුව රදාපවතී. බයිබලය පවසන ආකාරයට පියා තම භාර්යාවට කොන්දේසි විරහිතව ප්‍රේම කළ යුතුය. ඔහුගේ ප්‍රධාන ආදර්ශය එමගින් දරුවන්ට ලබා දෙයි. එමෙන්ම ඔහු දරුවන් සම්බන්ධව ක්‍රියා කරන ආකාරය ද ප්‍රේමය ප්‍රදර්ශන වන ආකාරය විය යුතුය. **"පියවරුනී, නුඹලාගේ දරුවන්ට කෝප නූපදවා ස්වාමින්වහන්සේගේ හික්මවීමෙන්ද අවවාදයෙන්ද ඔවුන් ඇති දැඩි කරපල්ලා" (එපීස 6:4 / කොලොස්සි 3:21).** බොහෝ දුරට පියවරු තම ප්‍රේමය සඟවාගෙන සිටින බවක් දක්නට ලැබේ. නමුත් එය හැම විටම සුදුසු නොවේ. ඔහු තම භාර්යාවට හා දරුවන්ට තම ආදරය දැනෙන්න සැලැස්විය යුතුය. ඔහු ස්වාමීන්වහන්සේ මත යැපෙන පුද්ගලයකු බව ප්‍රදර්ශන කිරීම තුළින්




පවුලේ අන් අයද භක්තිවන්ත ජීවිතයක් උදෙසා බලපෑමක් ඇති කරයි. දිනපතා බයිබලය කියවා දෙවියන්වහන්සේගෙන් අනුශාසනා හා මඟ පෙන්වීම ලබා ගෙන තම පවුල ස්වාමීන්වහන්සේගේ මාර්ග යේ පුරුදු පුහුණු කිරීම මඟින් සැබෑ කිතුණු පවුලක් ගොඩනැගිය හැක. මෙය පියාගේ වගකීමකි.

## නිවසේදී කළහැකි දේවල්

★ තම දරුවන්ට පෙනෙන ආකාරයට බයිබලය කියවීම යාච්ඤා කිරීම මගින් දරුවන්ට ආදර්ශයක් වීම.

★ දරුවන් ඉදිරියේ තම භාර්යාවට වරද නොතැබීම.

★ දරුවන් ඉදිරියේ අන් අය විවේචනය නොකිරීම.

★ දරුවන් ඉදිරියේ බොරු නොකියන්න. (බොරු කීම පාපයකි) කොහොමත් බොරු නොකියන්න.

★ දිනපතා දරුවන් සමඟ පවුලේ යාච්ඤාව පවත්වන්න.

මේ ආකාරයෙන් හැමවිටම දරුවන්ට ආදර්ශමත් ආකාරයෙන් හැසිරීම මගින් දරුවන් සුදුසු මාර්ගයේ පුහුණු කරගත හැකිය.



## මවගේ වගකීම.

පවුලේ භාරකාරත්වය දරන්නේ මවය. සෑම විටම කාර්ය බහුල ඇය බොහෝ විට හැගීම්බරය. තම දරුවන් හා ස්වාමිපුරුෂයා ගැන හැමවිටම වෙහෙසෙන මව, බොහෝ විට පවුලේ අන් අයගේ වැඩි අවධානයට ලක් නොවෙයි. ඇය අසනීප වූ විට මුළු පවුලම අසනීප වූවා සේ දැනේ. කිතුණු මවට ඉතා වැදගත් වන්නේ දිනපතා බයිබලය කියවීම හා යාච්ඤා කිරීමයි. මේ මගින් ඇයට අවශ්‍යය දෙවියන්වහන්සේගේ බලය, සැනසීම, බලාපොරොත්තුව හා පවුලේ ආරක්ෂාව අත්දැකිය හැක. කිතුණු පවුලක් ගොඩ නැගීමේදී බයිබලීය ප්‍රතිපත්ති අනුගමනය කරන ඕනෑම කෙනෙකුට දෙවියන්වහන්සේගේ ආශිර්වාදය හා

ආරක්ෂාව නිරන්තරයෙන් ලැබේ.

අද බොහෝ මව්වරු රැකියාවේ නිරත වේ. එවිට ඉරිදා සභාවට යෑම පමණින් සෑහීමට පත්වේ. ඒ මගින් අප ආගමික දෙමව්පියන් බවට පත් වේ. එවිට අප දරුවන්ද දේව භය ඇති දරුවන් නොව ඉරිදා පල්ලි යන දරුවන් බවට පත් වේ. මෙය ඉතා භයානක තත්වයකි. දෙවියන්වහන්සේ මත යැපෙන මවක්, භාර්යාවක්, පවුලට වාසනාවකි. එබැවින් දිනපතා බයිබලය කියවීම, යාච්ඤා කිරීම, සභාවට යෑම, එකිනෙකා සමඟ සහභාගීකම් පැවැත්වීම, වැනි ආත්මික ව්‍යායාම වල නිරතවීම හා තම ස්වාමිපුරුෂයාට ගෞරවාන්විත යටත් වීම හා ප්‍රේම කිරීම මගින් දරුවන්ට ආදර්ශමත් මවක් බවට පත්විය හැක. ඒ මගින් කිතුණු ආදර්ශමත් පවුලක් ගොඩනැගිය හැක.

## <u>දරුවන්ගේ වගකීම</u>

**එපීස 6:1** සඳහන් පරිදි දෙමාපියන්ට කීකරු වීමත් ගෞරව කිරීමත් දෙවියන්වහන්සේ දරුවන්ට අණ කර තිබේ. මෙය දෙවියන්වහන්සේගෙන් බොහෝ ආශිර්වාද ලැබීමට හේතුවන බව එහි සඳහන් වේ. යේසුස්වහන්සේ කුරුසිය මත ඇණ ගසා සිටියදී පවා තම මව පිළිබඳව සැලකිල්ල යොමු කොට ඇගේ අනාගතය පිළිබඳ සිතුවේය. දෙමාපියන්ට සැලකීම වර්තමානයේ පිරිහී ගොස්ය. ඒ අතර තම දෙමාපියන් බොහෝ සේ රැකබලා ගන්නා දරුවන්ද අප අතර සිටියි. ඔවුන් අගය කළ යුතුය. තරුණ දරුවන් හිතෝපදේශ පොත වඩ වඩා කියවිය යුතු යැයි මම සිතමි. එහි අඩංගු උපදේශයන් ඉතාම සිතට කා වදින සුළුය. එසේම දිනපතා බයිබලය කියවීම හා තම ජීවිතය සොදිසි කර බලා තමාවම නිවැරදි මාර්ගයට යොමු කර ගැනීම ඉතා වැදගත්ය. ජීවිතය වරද්දා ගතහොත් එය නිවැරදි කිරීම ඉතා අමාරුය. දේව භය ඇති දරුවන් බවට පත්වීම මගින් දෙවියන්වහන්සේගේ ආශිර්වාද හා මගපෙන්වීම තම ජීවිතයට එක් කර ගැනීම තුළින් ප්‍රයෝජනවත්, ආදර්ශමත් දරුවන් බවට පත් විය හැක. දරුවනි, දිනපතා බයිබලය කියවන්න. දෙවියන්වහන්සේ තමන්ට කුමක්ද කියන්නේ, පිළිබඳ සංවේදී වන්න.

2022 වසර හා ඊට පෙර ආපසු හැරී බලා එම කාලවලදී අපගේ පවුල් ජීවිතයේ වැරදුනු තැන් ලකුණු කරන්න. 2023 වසරේදී එම තැන් නිවැරදි කර ගැනීමට වගබලා ගන්න. අපි එක් වී සැබෑ කිණු පවුලක් ගොඩනගමු.

**- ගුරුහරු -**

# ගුරුවරයා හා ශිෂ්‍යයා

එක් සන්ධ්‍යාවක ගුරුවරයෙක් සහ ශිෂ්‍යයෙක් ඔවුනොවුන්ගේ තොරතුරු කතා බහ කරමින් ගොවිපලක් අසලින් ගමන් කරමින් සිටියහ. මෙසේ යන අතර මේ තරුණ සිසුවා යමක් දැක තම ගුරුවරයාට කතා කොට මෙසේ පැවසීය. අපිට විහිලුවක් කරල සතුටු වෙන්නට හොඳ අවස්ථාවක් ලැබිල තිබෙනවා ගුරුතුමනි. ඔබ තුමාට පේනවාද අර වැට උඩ වේලෙන්නට දමා තිබෙන සපත්තු ජෝඩුව, ඒක හැම තැනම ඉරිලා, සමහර කොටස් ගැලවී ඇති බව. අනේ ගුරුතුමනි, අපි ඒක අරගෙන කොහේ හරි සඟවමු. ඉන් පසු ගොවියා කරන්නේ කුමක්ද කියා බලා, අපිට සතුටු වෙන්න පුළුවනි.


මේ කථාව අසා සිටි ගුරුවරයා ඔහුට මෙසේ පැවසුවේය. එහෙම නෙමෙයි දරුවෝ, අපිට තව දෙයක් කරන්න පුලුවන්. අපි ඒක කරලා බලමුද? අපි ඒ සපත්තු දෙක ඇතුලට රන් පවුම බැගින් දමා සැඟවී බලා සිටිමු ඔහු කරන්නේ කුමක්ද කියා. ඉතිං තරුණයා එයට එකඟ වී සපත්තු දෙක තුලට පවුම බැගින් දමා එය තිබු ලෙසම එය වේලෙන්නට තැබුවේය.

ටික වේලාවකින් අත පය සෝදා පිරිසිදු කරගත් ගොවියා එතැනට පැමිණ ඔහුගේ සපත්තු දෙක දමන්නට උත්සහ කළා. ඒත් යමක් ඔහුගේ කකුලේ පැටළුන නිසා ඔහු සපත්තුව පතුල දෙස බැලුවාය. ඔහු දුටු දෙයින් පුදුමව අනික් සපත්තුවේද එලෙසම තිබෙන බව දැක ඉතාම ප්‍රීතියෙන් අත් ඉහලට ඔසවා දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්නට පටන් ගත්තේය. ඔහු කෑගසමින් මෙසේ පැවසුවේය. "දෙවියන්වහන්ස ඔබ වහන්සේට ස්තූති වේවා. මගේ දරුවන්ට අද හොඳ කෑම වේලක් දෙන්න පුළුවන්. මගේ බිරිඳට බෙහෙත් ටික ගන්න පුළුවන්, මගේ ණය ප්‍රශ්ණ විසඳගන්න පුළුවන්". කියමින් ඔහු ප්‍රසංශා කළේය. මෙය දුටු තරුණයාගේ ඇසට කඳුලක් නැගුණේය. ඒ මොහොතේම ඔහු තම ගුරුවරයාට ස්තූති කළා, ඔහුව වැරදි දේ කිරීමෙන් වලක්වා නිවැරදි දේ කරන්නට මඟ පෙන්නූ නිසා. අපටත් ජීවිතයේ මෙවැනි අවස්ථාවන් හමු වෙන්නට පුළුවන්. ඉතිං ඒ හැම විටම දෙවියන්වහන්සේ ඉදිරියෙහි අන් අය සතුටුවන දේවල් කරන්නට අපිත් අදිටන් කර ගනිමු.

එමෙන්ම පරිණත අය තරුණ අයට හරි දේ කිරීමට මඟපෙන්විය යුතුය. මේ නත්තල් සමයේ යහපත් දේ කිරීමටත් අන් අය සමඟ බෙදා හදා ගැනීමටත් අමතක නොකරමු. ඒ තුළින් දෙවියන්වහන්සේගේ නාමයට ගෞරවය හා ප්‍රසංශාව ගෙනෙමු.

**- තබීතා -**

# දෙවියන්වහන්සේගේ අනුග්‍රහය යනු කුමක්ද?



**"මක්නිසාද ව්‍යවස්ථාව මෝසෙස් කරණකොටගෙන දෙන ලද්දේය. අනුග්‍රහය හා සත්‍යය පැමිණුණේ යේසුස්වහන්සේ කරණකොටගෙනය" (යොහන් 1:17).**

ව්‍යවස්ථාව සහ අනුග්‍රහය අතර ඇති වෙනස පිළිබඳව මෙම දේව වචන පදය ඉඟියක් දෙයි. ව්‍යවස්ථාව පැමිණුණේ මෝසෙස් කරණකොටගෙනය. එහෙත් දෙවියන්වහන්සේගේ කරුණා අනුග්‍රහය ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන පැමිනුණ බව ප්‍රකාශ කිරීමෙන් කාල වකවානු දෙකකදී දෙවියන්වහන්සේ මනුෂ්‍යා සමඟ ස්ථාපිතකළ සම්බන්ධතාවයෙහි ඇති වූ වෙනස පෙන්නුම් කෙරේ. පරණ ගිවිසුම යනුවෙන් අප හඳුන්වන මෝසෙස්ගේ මැදහත්කාරකම ඇතුව දෙවියන්වහන්සේ මිනිසා සමඟ කළ ගිවිසුම කරණකොටගෙන දෙවියන්ව හන්සේගේ නීති සංග්‍රහය නොහොත් ව්‍යවස්ථාව රජකම් කරන්නට පටන් ගත්තේය. එහෙත් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මැදහත්කාරකමින් යුතුව දෙවියන්වහන්සේ මිනිසා සමඟ කළ ගිවිසුමෙන් පසු දෙවියන්වහන්සේගේ අනුග්‍රහය රජකම් කරන්නට පටන් ගනී. එම ගිවිසුම අළුත් ගිවිසුම ලෙස හැඳින්වේ. පරණ ගිවිසුම මෝසෙස් කරණකොටගෙන සීනයි කන්දේ දී ස්ථාපිත කරන ලදී. එහෙත් අළුත් ගිවිසුම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන කල්වාරි කන්දේදී ආරම්භවිණි. එකක් ව්‍යවස්ථාව රජකමට පත්කළ අතර අනෙක කරුණා අනුග්‍රහය රජකමට පත් කළේය. අපගේ ඇදහිලිවන්ත ජීවිතයේ වැඩි වර්ධනය සඳහා මෙම වෙනස නිසි ලෙස තේරුම් ගත යුතුවෙමු. එහෙත් අවාසනාවන්ත ලෙස මෙම වෙනස හරිහැටි නොදකින කිතුනුවා ව්‍යවස්ථාව සහ අනුග්‍රහය මිශ්‍රකර තේරුම් ගැනීම හා ජීවිතයට අදාල කර ගැනීම තුළින් වියවුල් තත්වයකට පත්ව සිටී. මේ හේතුවෙන් කිතුනුවා දෙලොවක් අතර ජීවත් වන්නාක් මෙන් පැරණි හා අළුත් ගිවිසුම ඉගැන්වීම අතර මැද අතරමං වී සිටී.

ශුද්ධ ලියවිල්ලෙහි ඉගැන්වීම් තුළ පරණ ගිවිසුම හා අළුත් ගිවිසුම් මිශ්‍ර කිරීමක් හෝ ව්‍යවස්ථාව හා අනුග්‍රහය මිශ්‍ර කිරීමක් සිදුකොට නැත. ව්‍යස්ථාවට සැමවිටම තිබුනේ අනුග්‍රහයට වඩා වෙනස් වූ කාර්ය භාරයකි.

- ව්‍යවස්ථාව නම් දෙවියන්වහන්සේ යම් යම් දේ තහනම් කිරීමත් සහ බලකිරීමත්ය. එහෙත් අනුග්‍රහය නම් දෙවියන්වහන්සේ යම් යම් දේ අපට ප්‍රදානය කිරීමත් සහ ආයාචනය කිරීමත්ය.

- ව්‍යවස්ථාව වරදට පත්කිරීමේ සේවයකි. එහෙත් දෙවියන්වහන්සේගේ කරුණා අනුග්‍රහය යනු කමාව දීමේ සේවයකි.

- ව්‍යවස්ථාව ශාපයක් ගෙන එයි. එහෙත් කරුණා අනුග්‍රහය එම ශාපයෙන් අප මුදයි.

- ව්‍යවස්ථාව අපේ මරණය සිදුකරයි. කරුණා අනුග්‍රහය අපව ජීවත් කරවයි

- ව්‍යවස්ථාව සිදුකරන්නේ එය ඉදිරිපිට මිනිසාගේ කට වැසීමයි. එහෙත් කරුණා අනුග්‍රහය දෙවියන්වහන්සේව ප්‍රසංශා කරන පිණිස මිනිසාගේ මුව විවර කරයි.

- ව්‍යවස්ථාව දෙවියන්වහන්සේ හා මිනිසා අතර ඇති දුරස්ථභාවය වැඩි කරයි. එහෙත් කරුණා අනුග්‍රහය මිනිසා දෙවියන්වහන්සේගේ අභිමුඛයට පමුණුවයි.

- ව්‍යස්ථාව පවසනුයේ " **ඇසකට ඇසක්ය, දතකට දතක්ය**" කියා ය. එහෙත් අනුග්‍රහය "**නුඹේ එක් කම්මුලකට ගසන්නාට අනිකත් හරවාපන්න**"යයි පවසයි.

- නීති පිළිපැද ජීවත්වන්නැයි ව්‍යවස්ථාව පවසයි. එහෙත් කරුණා අනුග්‍රහය පවසන්නේ විශ්වාස කර ජීවත්වෙන්න කියා යි.

- ව්‍යවස්ථාවට මිෂනාරිවරුන් නැත. එහෙත් කරුණා අනුග්‍රහය සියලු ජාතීන්ට දේශනා කළ යුතුව ඇත.

- ව්‍යවස්ථාව මගින් ඉතාම හොඳ මිනිසාත් වරදට පත්කරයි. එහෙත් කරුණා අනුග්‍රහයෙන් ඉතා නරකම මිනිසාත් ධර්මිෂ්ඨකොට ගණන් ගනී.

- ව්‍යවස්ථාව කාමමිථ්‍යාචාරිනියට ගල් ගසයි. එහෙත් අනුග්‍රහය පවසන්නේ "**මමද නුඹ වරදට පත් නොකරමි. ගොස් තවත් පව් නොකරන්න**" කියාය.

- ව්‍යවස්ථාව යටතෙහි එඬේරාගේ පාප වෙනුවෙන් බැටළුවා මරණයට පත් කරනු ලැබේ. එහෙත් අපූරු දෙය නම් ! අනුග්‍රහය යටතෙහි බැටළුවන්ගේ පාප වෙනුවෙන් එඬේරා මරණයට පත් වෙයි.

ඉහත ආකාරයට ශුද්ධ ලියවිල්ලෙහි සැමතැනකම වාගේ දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව සහ දෙවියන්වහන්සේගේ කරුණා අනුග්‍රහය අතර ඇති වෙනස පැහැදිලි කර තිබේ. වර්තමානයේ මේ දෙක මිශ්‍ර කොට ඉගැන්වීම තුළින් දෙකම නරක්වී තිබේ. ව්‍යවස්ථාවේ සරුභාවය හා අනුග්‍රහයේ සෞම්‍යභාවය යන දෙකම හීනකර දැමීමට වර්තමාන කිතුනු ඉගැන්වීම් සමත්වී තිබේ.

කෙසේවෙතත්, දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාව සහ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය යන දෙකම මිනිසා මෙලොව මවනු ලැබූ දවසේ පටන් ක්‍රියාත්මක වූ

බව අප දැනගත යුතුය. පරණ ගිවිසුම් වකවානු තුළදී ද දෙවියන්වහන්සේ විසින් මිනිසා පිළිගනු ලැබුවේ අනුග්‍රහය පදනම් කරගෙනය. එලෙසම වර්තමාන අළුත් ගිවිසුම් යුගයේ දෙවියන්වහන්සේගේ අනුග්‍රහය පිළිනොගන්නා අය කෙරෙහි ව්‍යවස්ථාව බලපවත්වයි. අවසානයේදී. එම ව්‍යවස්ථාව කරණකොටගෙන මිනිසා විනිශ්චය කරනු ලබයි. එහෙත්




**"ව්‍යවස්ථාව මෝසෙස් කරණකොටගෙන දෙනලද්දේය. අනුග්‍රහයද සත්‍යයද පැමිණුණේ යේසුස්වහන්සේ කරණකොට ගෙනය"** යන වදන්වලින් අළුත් ගිවිසුම් යුගයේ ප්‍රමුඛස්ථානයෙහි වැජඹෙන්නේ අනුග්‍රහය බව සිහි කරනු ලබයි. වෙනත් වචනවලින් පවසතොත් වර්තමාන යුගයේ රජකම් කරනුයේ අනුග්‍රහයයි.

අපි දැන් දෙවියන්වහන්සේගේ අනුග්‍රහය තවදුරටත් තේරුම් ගන්නට බලමු. දෙවියන්වහන්සේගේ අනුග්‍රහය මනාව විස්තර කෙරෙන දේව වචන පද කිහිපයක් මෙසේය.

**"නමුත් අපගේ ගැලවුම්කාරයාණන් වන දෙවියන්වහන්සේගේ ගුණවත්කම ද මනුෂ්‍යයන් කෙරෙහි ඇති ප්‍රේමය ද ප්‍රකාශ වු කල, අප විසින්ම කළාවු ධර්මිෂ්ඨකමේ ක්‍රියාවලින් නොව තමන්වහන්සේගේ දයාව ලෙස නැවත ඉපදීම නැමති සේදීමෙන්ද ශුද්ධාත්මයාණන්වහන්සේගේ අලුත් කිරීමෙන්ද උන්වහන්සේ අප ගැලවූ සේක" (තීතස් 3:4:5).**

**"එසේ කළේ, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ අප කෙරෙහි ඇත්තාවූ කරුණාවන්තකම නිසා තමන්වහන්සේගේ අනුග්‍රහයේ ඉතා මහත් සම්පත, පැමිණෙන්නාවු කාලවලදී පෙන්වන පිණිසය" (එපිස 2:7).**

**"නමුත් දෙවියන්වහන්සේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ මරණය විඳීමෙන්ය" ( රෝම 5:8).**

ඉහත පද අනුව දෙවියන්වහන්සේගේ අනුග්‍රහය යනු දෙවියන්වහන්සේ **ගුණවත්තකමද ප්‍රේමයද** අප කෙරෙහි ඇත්තාවු **කරුණාවන්තකමද වේ**. තව ද **අප පව්කාරයන්ව සිටියදීම** යයි කීමෙන් අපගේ සුදුසුකමක් පදනම් කර නොගෙන අපේ යහපත උදෙසා දෙවියන්වහන්සේ ක්‍රියාකිරීම අදහස් කෙරේ. අනුග්‍රහය නම් අප ලැබීමට නුසුදුසු දේ දෙවියන්වහන්සේ නොමිලයේ අපට ප්‍රදානය කිරීමයි. පව්කමාව, සදාකාල ජීවනය, ගැලවීම, දේව දරුකම, ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩසිටීම හා ස්වර්ගය වැනිදෑ අප ලබන්නට අයිතියක් නැතිදෑය. එහෙත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන ඒ දෑ දෙවියන්වහන්සේ විසින් අපට නොමිලයේ ප්‍රදානය කරන සේක.

**("ව්‍යවස්ථාව ද? අනුග්‍රහයද?" පොතෙන් උපුටාගන්නා ලදී)**

**කතෘ - නෙවිල් ජයසුන්දර**




# අඳුරෙන් ආලෝකයට

මා උපත ලැබුවේ සාමාන්‍යය පවුලක පවුලේ බාල පිරිමි දරුවා ලෙසය. කුඩා කළ පටන් ජීවිතයේ බොහෝ අභියෝගයන්ට මුහුණ දෙන්නට මගේ පවුලේ අයටත් මටත් සිදුවුණි. මා ඉපදී හැදී වැඩුනේ මත් කුඩු, ජාවාරම්, පිහි ඇනුම්, මංකොල්ලකෑම්, රණ්ඩු සරුවල් වලින් පිරුණු පේලි ගෙවල් වලින් යුතු ප්‍රදේශයකය. කුඩා කාලයේ සිටම මෙවැනි දේ මට නුපුරුදු දේවල් නොවීය. සෑම විටම මිනිසුන් බහුලව එහා මෙහා යන කතා බහ කරන පරිසරයක් මා අවට තිබුණි. යම් නිශ්ශබ්දතාවයක් වූයේ නම් ඒ මහ රෑට පමණකි. මේ පරිසරය තුළ හැදී වැඩුණු මම සමාජශිලි දරුවෙකු විය. ක්‍රමයෙන් තරුණ වයසට එළඹෙන විට බෝහෝ මිතුරු කණ්ඩායම් වල මම සමාජිකයෙක් වූයෙමි. නිරායාසයෙන්ම මතට මම ඇලුම් වූයෙමි. ඒ මගේ සමාජයේ එය සැබවින්ම සාමාන්‍ය තත්වයක් වූ නිසාවෙන් බව මට දැන් හැගේ. කාලය වේගයෙන් ගත විය. මගේ ජීවිතයද සාමාන්‍ය පරිදි ගෙවී ගියේය. මේ කාලය වන විට මගේ ප්‍රදේශයේම ජීවත් වූ එක් තරුණ සහෝදරයෙක් දේව වචනය කියා දෙන්නට අපි තරුණයන් කිහිප දෙනෙකු ඔහුගේ නිවසට රැ ස්කරවා ගත්තේය. ඒවගේම ඉරිද දින අපිව ඔහු යන සභාවට රැගෙන යාමට ඔහු බොහෝ උත්සහගත්තේය. ඔහුගේ වචනයට පිටු පෑමට නොහැකි නිසා ඔහු සමග සභාවට ගිය මුත් මගේ ජීවිතයේ සුපුරුදු ක්‍රියාකාරකම් හා සුපුරුදු ඇබ්බැහි වීම් වල වෙනසක් වුණේ නැත.

සභාවට යන්නට පටන් ගත් විට සභා පරිසරය තුළ තිබුණු අමුතු බවක් මට දැණුනේ මා ජීවත්වන පරිසරයට වඩා එය බෙහෙවින් වෙනස් වුණ නිසා බව මට තේරුම් ගියා. නිතර අසභ්‍ය වචන කන වැකුණු මට මිහිරි වදන් සහ උණුසුම් පිළිගැනීමත් සභාවේ තරුණ තරුණියන්ගෙන් මට ලැබුණු අතර එම වෙනස මට තදින්ම දැනෙන්නට විය. මා සභාවට රැගෙන ආ සහෝදරයා මා එක් වැඩිමල් සහෝදරයෙකුට හඳුන්වා දුන්නා. වැඩිමල් සහෝදරයාගේ කතාව සහ ආචාරශිලි බවට මා පුදුම විදියට ඇලුම් කරන්නට සහ ගෞරවකරන්නට පටන්ගත්තා. ඉන් ඉදිරියටත් මා සභාවට පැමිණි සෑම විටම ඔහු මා සමඟ කතා බහ කර මා ගැන සොයා බැලුවා. දේව වචනය හෝ යේසුස්වහන්සේ ගැන අල්පමාත්‍රයක දෙයක් මගේ මනසෙහි නොවූවත් සභාවෙහි මේ ආචාරශිලි සහ ප්‍රසන්න වතාවරණයට මා සිත ඇදීගියා යැයි කීවොත් නිවැරදියි. නමුත් තවමත් මගේ සුපුරුදු ක්‍රියාකාරකම් සහ සුපුරුදු

ඇබ්බැහි වීම් වල වෙනසක් සිදුවුණේ නැත.

මේ කාලයේදි සභාව විසින් සංවිධානය කළ තරුණ කඳවුරකට සහභාගී වීමට මට අවස්ථාවක් ලැබුණි. තරුණ කඳවුර පැවත්වූ දින තුන තුළ යේසුස්වහන්සේ ගැන යම් යම් දේ මගේ හදවතට කිඳා බැස ගිය අතර යේසුස්වහන්සේව මගේ ජීවිතයේ ගැළවුම්කරුවාණන් ලෙස පිළිගැනීමට මට ආශාවක් ඇති විය. යේසුස්වහන්සේ පිළිගත්තත් ඇබ්බැහි වීම් වලින් මිදීමට මට නොහැකි වුණා. එසේ කිරීමට මම බොහෝ අධිෂ්ඨානයන් සහ උත්සහයන් ගත්තත් බොහෝ අවස්ථාවල මම අසමත් වුණා. නැවතත් පුරුදු ඇබ්බැහි වීමටම ලොල් වුණා. පුළුවන් සෑම අවස්ථාවකදීම සභාවට ගිය මා එහි පැවැත් වු රැස්වීම් වලටද සහභාගි වන්නට අධිෂ්ඨාන කර ගත් අතර බයිබලයක් ලබාගෙන එය කියවීමට හා යාච්ඤා කිරීමටත් උනන්දු වුණා. කාලය සෙමෙන් ගත වන අතර බයිබලයේ සඳහන් දේ කියවා තේරුම් ගැනීමටත්, යේසුස්වහන්සේ ගැන බොහෝ දේ දැන ඉගෙන ගැනීමටත් මට පුලුවන් වුණා. මේ කාලය වන විට කිතුණු වටපිටාවකින් යුතු සේවක මඩුල්ලක් අතරම මට රැකියාවක් ලැබුණු නිසා දවසේ බොහෝ වෙලාවක් මට සුපුරුදු වටපිටාවෙන් ඉවත්ව කිතුණුවන් සමඟ ගැවසීමට, කතාබහ කිරීමට හා කාලය ගත කිරීමට හැකි වූ නිසා බොහෝ දුරට මා ඇබ්බැහි වීම් වලින් ඈත්වන්නට වුණා. මෙය මගේ ජීවිතයේ ලැබූ මහත් ජයග්‍රහණයක් විය.

පසුව මම සැබවින්ම යේසුස්වහන්සේ මගේ ජීවිතයේ ගැලවුම්කරුවාණන් ලෙස පිළිගෙන, බයිබලය කියවීමටත් යාච්ඤා කිරීමටත් දැඩි උත්සහයකින් කැපවුණා. බොහෝ විට මා අසමත් වුණාත් යේසුස්වහන්සේ තුළම රැඳී උන්වහන්සේ සමඟම සිටින්නට උන්වහන්සේ මට උපකාර කළා. ඇබ්බැහි වීම් වලින් මිදෙන්නට ලෙහෙසි දෙයක් නොවූ අතර මා ඒ සඳහා කළ සෑම උත්සහයක්ම නිෂ්ඵල වුණා. නමුත් යේසුස්වහන්සේට මගේ ජීවිතය සැබවින්ම කැප කළ විට උන්වහන්සේ මාව මුළුමනින්ම මුදගත් සේක. දැන් මා විවාහ වී බිරිඳ සහ මගේ ආදරණීය දියණිය සමඟ සතුටෙන් සමාදනයෙන් ජීවත් වෙමි. අප තවමත් ජීවත් වන්නේ සුපුරුදු පරිසරයේය. එහෙත් මම සියලු ඇබ්බැහිවීම් වලින් ජයගෙන අලුත් ජීවිතයක් ගත කරන අතර සාතන්ගේ සියලු ක්‍රියාවන්ට ඉහලින් වු උන්වහන්සේගේ නොමියෙන ප්‍රේමය සහ බලය අප දිනපතා අත්විඳියි. මගේ ජීවිතය මුළුමනින්ම වෙනස්කළ මාගේ ස්වාමි වු යේසුස්වහන්සේට සදාකාලයටම ප්‍රශංසා වේවා ! ගෞරව වේවා !

**- තරංග නිශාන්ත -**

# දිනපතා ආත්මික ව්‍යායාම

- ★ දිනපතා බයිබලය කියවන්න.
- ★ දිනපතා වේලාවක් වෙන් කරගෙන යාච්ඤා කරන්න.
- ★ දිනපතා දෙවියන්වහන්සේට ස්තූති, ප්‍රශංසා, නමස්කාර කරන්න. (නිවසේදී)
- ★ සෑම ඉරුදිනකම සභාවට යන්න.
- ★ ඔබගේ ආදායමෙන් දෙවියන්වහන්සේගේ කොටස වෙන් කර පූජා කරන්න.
- ★ සෑම විටම අන් අයට යහපත් ක්‍රියාවන් කරන්න.
- ★ සෑම විටම සුභාරංචිය තව කෙනෙකුට සරලව පවසන්න.

www.christianfellowshipcentre.com

Cfc Colombo (Christian Fellowship Centre)

CFC Colombo


ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය
අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2 581 901 / 077 8 813 197
www.christianfellowshipcentre.com



NMA GRAPHICS
No. 246/1, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmail.com